රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය **இணைந்த சேவைகள் பிரிவு** **COMBINED SERVICES DIVISION**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. Independence Square, Colombo 07, Sri Lanka

| | | | |
|---|---|---|---|
| දුරකතන<br>தொலைபேசி:**(94) 011- 2694560**<br>Telephone | ෆැක්ස්<br>தொலைநகல்:**(94) 011- 2692254**<br>Fax | ඊ-මේල්<br>மின்னஞ்சல்:**dgcs@pubad.gov.lk**<br>E-mail | වෙබ් අඩවිය<br>இணையத்தளம்: **www.pubad.gov.lk**<br>Web Site |

---

| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | කා.සේ.සේ./V16/ ආ.ක.කා.කි. | ඔබේ අංකය<br>உமது இல<br>Your No | |
| දිනය<br>திகதி:<br>Date | 2022.09.15 | | |

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශිය ලේකම්වරුන් වෙත

<u>**අමාත්‍යාංශ වෙබ් අඩවිය සහ විද්‍යුත් තැපැල භාවිතය තුලින් ඒකාබද්ධ සේවාවල නිලධාරීන්ගේ කටයුතු කාර්යක්ෂම කිරීම හා හැකිතාක් දුරට මුද්‍රිත ලිපිලේඛණ භාවිතය අවම කිරීම**</u>

ඒකාබද්ධ සේවාවන් 7කට අයත් නිලධාරීන් 140,000 පමණ ප්‍රමාණයක් සඳහා සේවා සැපයීමේදී සිදු විය හැකි ප්‍රමාදයන් අවම කිරීමට සහ වඩා කාර්යක්ෂම සේවාවක් සැපයීමට ඇතැම් ආයතනික කටයුතු මාර්ගගතව (online) ලබා දීමට ඒකාබද්ධ සේවා අංශය කටයුතු කර ඇත.

02. පවතින තත්ත්වයන් යටතේ වුවද සීමිත සම්පත් අරපිරිමැස්මෙන් භාවිතා කිරීමේ අරමුණින් පහත ක්‍රමෝපායන්ද යොදා ගැනීමෙන් තවදුරටත් ලබා දෙන සේවාවන් කාර්යක්ෂම කල හැකි බව නිරීක්ෂණය වන බැවින් පහත කරුණු පිළිබඳව අදාළ නිලධාරීන් දැනුවත් කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

03. ඒ අනුව ඒකාබද්ධ සේවා අංශය වෙත ලැබෙන පහත ඉල්ලීම්වලට අදාළව තීරණ ගැනීමට අවශ්‍ය වන තොරතුරුවල අඩුපාඩු කැඳවීම්, 2022.09.15 දින සිට මුද්‍රිත ලිපි භාවිතයෙන් සිදු නොකරන අතර එදින සිට අඩුපාඩු කැඳවීම් සෑම සඳුදා දිනයකදීම මෙම අමාත්‍යාංශයීය වෙබ් අඩවියේ පමණක් පළ කිරීමට කටයුතු සිදු කරනු ලැබේ. එම අඩුපාඩු කැඳවීම් ලේඛන https://bit.ly/cmblist-s දිගුව (link) ඔස්සේ පිවිස අදාල සේවා අනුව පරීක්ෂා කළ හැක. (එම දිගුවේ QR කේතය ලිපිය අවසානයේ දක්වා ඇත.)

I. සේවය ස්ථිර කිරීම
II. ශ්‍රේණිගත උසස් කිරීම
III. විදේශ නිවාඩු ඉල්ලීම
IV. කාර්යක්ෂමතා කඩඉම් සහන ඉල්ලීම
V. විශ්‍රාම ගැන්වීම
VI. මුදාහැරීම්, ඉල්ලා අස්වීම්
VII. භාණ්ඩාගාර චක්‍රලේඛ 394 අනුව නම වෙනස් කිරීම
VIII. වැඩ බැලීම්/රාජකාරී ඉටු කිරීම් සඳහා අනුමැතිය ලබා දීම් සහ මෙම අංශය වෙත ලැබෙන අනෙකුත් ඉල්ලීම්

04. වෙබ් අඩවියේ පළ කරනු ලබන අඩුපාඩු සඳහා පිළිතුරු එවීමට ලියාපදිංචි හෝ සාමාන්‍ය තැපැල පමණක් භාවිතා කරන ලෙසත් එහි පිටපත් නැවතත් නිලධාරියා සමඟ හෝ තැපැලෙන් එවීමෙන් වළකින ලෙසත් වැඩිදුරටත් දන්වා සිටිමි. තවද පිළිතුරු එවීමේදී “ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්” වෙත එම

ලිපි යොමු කරන ලෙසත් ලියුම් කවරයේ වම් පස ඉහලින් නිලධාරියා අයත් සේවාව සහ අදාල කරුණ (උදා: කළමනාකරණ සේවා නිලධාරි සේවයේ නිලධරයකුගේ ස්ථිර කිරීමකදී නම් **<u>ක.සේ.නි.සේ. - ස්ථිර කිරීම්</u>** ලෙස හා කාර්යාල සේවක සේවයේ නිලධරයකුගේ ස්ථාන මාරුවකදී නම් **<u>කා.සේ.සේ - ස්ථාන මාරු</u>** ලෙස) පැහැදිලිව සඳහන් කිරීම තුලින් අනවශ්‍ය ප්‍රමාදයන් වලක්වා ගත හැකි බවත් දන්වමි.

05. එමෙන්ම ඔබ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ ආයතනය වෙත ඉදිරියේ දී යොමු කරන ඇතැම් ලිපි විද්‍යුත් තැපැල මඟින් පමණක් යොමු කිරීමට නියමිත බැවින් ඒ සඳහා ඔබ සේවා ස්ථානයේ භාවිතා කරනු ලබන වලංගු විද්‍යුත් තැපැල් ලිපිනය නිවැරදිව සඳහන් කර මීළඟ ඉල්ලීම සමග යොමු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

06. තවද මෙම අංශය වෙත දෛනිකව ලැබෙන ලිපි පිටපත් අතුරින් බොහෝ ප්‍රමාණයක් නැවත නැවතත් යොමු වන බව හා අත්‍යවශ්‍ය නොවන බව නිරීක්ෂණය වී ඇත. එබැවින් පහත කරුණු පිළිබඳව යොමු කරන ලිපි පිටපත් තාවකාලිකව ඒකාබද්ධ සේවා අංශය වෙත යොමු නොකරන ලෙසද කාරුණිකව දන්වමි.

I. සේවය ස්ථිර කිරීම්, ශ්‍රේණිගත උසස් කිරීම් පිළිබඳ ලිපි ලද බවට හා එම ලිපි අදාළ නිලධාරියා වෙත යොමු කළ බවට ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කිරීම පිණිස එවන ලිපි පිටපත්

II. භාෂා දිරි දීමනා ගෙවීම්, පරිගණක පුහුණු දීමනා ප්‍රතිපූර්ණය කිරීම් යනාදිය නිලධරයාට දැන්වීමේ ලිපිවල පිටපත්

III. වැටුප් වර්ධක හා වැටුප් පරිවර්තන ලිපිවල පිටපත්

IV. වැඩ බැලීම්, විදේශ නිවාඩු හා විශ්‍රාම ගැන්වීම් සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලැබීමෙන් පසු ඒ පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නිලධාරියාට දැනුම් දීමේ ලිපියේ පිටපත්

V. කළමනාකරණ සේවා නිලධාරි සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කිරීමේ දින 10 පාඨමාලාව සම්පූර්ණ කළ බව දැනුම් දීමෙන් පසු ඒ සම්බන්ධව නැවත එවන ලිපි පිටපත්

VI. ප්‍රසූත නිවාඩු අවසන් කිරීමෙන් පසු සේවයට වාර්තා කළ බවට දන්වන ලිපි පිටපත්

VII. හදිසි අනතුරු වන්දි සම්බන්ධ සියලු ලිපි

07. අභ්‍යන්තර ස්ථාන මාරු හා තාවකාලික අනුයුක්ත කිරීම්වල ලිපි පිටපත්ද ස්ථාන මාරු හා මුදාහැරීම් සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලැබීමෙන් පසු ආයතන මඟින් සිදු කරනු ලබන මුදාහැරීම්වලට අදාළ ලිපි පිටපත් පෙර පරිදිම ඒකාබද්ධ සේවා අංශය වෙත එවිය යුතු බවද දන්වමි.

08. නිලධාරීන් විසින් ලබාගන්නා නිවාඩු (ප්‍රසූත නිවාඩු, ඉකුත් නිවාඩු, හදිසි අනතුරු නිවාඩු හා අනෙකුත් සියලු නිවාඩු ) පිළිබඳ වාර්තා, රාජ්‍ය භාෂා ප්‍රවීණතා අවශ්‍යතාවය සම්පූර්ණ කළ බවට/නිදහස් කළ බවට නිලධාරියාට දන්වන ලද ලිපි පිටපත් හා කාර්යක්ෂමතා කඩඉම් විභාග ප්‍රතිඵල නිලධාරියාට දන්වන ලද ලිපි පිටපත් යනාදිය පත්වීම් ස්ථිර කිරීමේදී, උසස් වීම් ලබාදීමේදී අනෙකුත් ලේඛන සමඟ හෝ විශේෂ උපදෙස් ලබා ගැනීමේදී පමණක් යොමු කරන ලෙසත් දන්වමි. අත්‍යවශ්‍ය ලිපි පිටපත් යොමුකිරීමේදී හැකිතාක් ද්විත්ව පැති (both sides) ලෙස මුද්‍රණය කර එවීමට කටයුතු කරන ලෙසත් වැඩිදුරටත් දන්වමි.

09. මෙම අංශය වෙත යොමු කරන ලද ලිපි පිළිබඳ සියලු විමසීම් සඳහා ඇමුණුම 01හි දක්වා ඇති විද්‍යුත් තැපැල් ලිපිනයන් භාවිතා කරන ලෙසද ෆැක්ස් භාවිතය හැකිතාක් අවම කරන මෙන්ද ඉල්ලමි.

10. සංවර්ධන නිලධාරී සේවය සඳහා නිකුත් කර ඇති මාගේ අංක CS/DOS/Policy/පොදු, CS/DOS/Policy/පොදු/01 හා 2022.06.16 , 2022.06.20 දිනැති ලිපි මඟින් නිකුත් කර ඇති උපදෙස් එලෙසින්ම ක්‍රියාත්මක කරන මෙන්ද දන්වමි.

11. සම්පත් අරපිරිමැස්මෙන් භාවිතා කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කරන මෙම වැඩපිළිවෙල සඳහා ඔබගේ සහයෝගය කාරුණිකව අපේක්ෂා කරමි.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

දුරකථන : 0112-694560

(අඩුපාඩු කැඳවීම් ලේඛන ඇතුලත් වෙබ් පිටුවට පිවිසීමේ දිගුවේ (link) QR කේතය)

ඇමුණුම 1

| නම | තනතුර | ඊමේල් ලිපිනය |
|---|---|---|
| බී.එන්. ලියනගේ මිය | ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ I (කළමනාකරණ සේවා නිලධාරී සේවය) | dcs1.pubad@gmail.com |
| ඒ.එම්.එන්.අමරසිංහ මයා | ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ II (විනය, බඳවා ගැනීම් හා විභාග, උපාධිධාරී අභ්‍යාසලාභී බඳවා ගැනීම් සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය) | dcs2.pubad@gmail.com |
| ඒ.එම්.එන්.අමරසිංහ මයා (රාජකාරි ආවරණ) | ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ III (රජයේ භාෂා පරිවර්තක සේවය , ශ්‍රී ලංකා පුස්තකාලයාධිපති සේවය , ඒකාබද්ධ රියදුරු සේවය හා කාර්යාල සේවක සේවාව) | dcs3.pubad@gmail.com |
| එල්.ඩී.වී.තිලකරත්න මයා | ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ IV (සංවර්ධන නිලධාරී සේවය) | dcs4.pubad@gmail.com |
| | **කළමනාකරණ සේවා නිලධාරී සේවය** | |
| යූ.එම්.එස්.එස්.මධුෂංක මයා | ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ (කළමනාකරණ සේවා නිලධාරී සේවය - I ශ්‍රේණිය) | adcs1.pubad@gmail.com |
| අයි.ගලප්පත්ති මිය | ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ (කළමනාකරණ සේවා නිලධාරී සේවය - IIශ්‍රේණිය) | adcs2.pubad@gmail.com |
| එම්.එන්.එච්.පීරිස් මිය | ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ (කළමනාකරණ සේවා නිලධාරී සේවය - III ශ්‍රේණිය) | adcs3.pubad@gmail.com |
| කේ.එම්.කේ.කේ කුලතුංග මිය | ඒකාබද්ධ සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ (කළමනාකරණ සේවා නිලධාරී සේවයේ ස්ථාන මාරු හා කළමනාකරණ සේවා නිලධාරී සේවය - අධිශ්‍රේණිය ) | ddcs4.pubad@gmail.com |
| **රජයේ භාෂා පරිවර්තක සේවය, ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවය. ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය . ඒකාබද්ධ රියැදුරු සේවය. කාර්යාල සේවක සේවය** | | |
| පී.එමාලිනි මිය | ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ (කාර්යාල සේවක සේවය) | adcs5.pubad@gmail.com |
| එස්.ඩබ්.සී.එච්. රුවන්පුර මිය | ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ (රජයේ භාෂා පරිවර්තක සේවය, ශ්‍රී ලංකා රජයේ | adcs6.pubad@gmail.com |

| | | |
|---|---|---|
| | පුස්තකාලයාධිපති සේවය, ඒකාබද්ධ රියැදුරු සේවය) | |
| කේ.එම්.එන් දිල්හාරි මිය | ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය) | adcs7.pubad@gmail.com |
| | **සංවර්ධන නිලධාරී සේවය** | |
| යු.එම්.එස්.එස්.මධුෂංක මයා | ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ (ස්ථාන මාරුවීම්) | adcsdos1.pubad@gmail.com |
| එම්.කේ.ඊ.එස්.කේ ජයවර්ධන මිය | ඒකාබද්ධ සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ (මුදා හැරීම්, විදේශ නිවාඩු, නම් වෙනස් කිරීම්, වැඩ බැලීම් හා වෙනත් ආයතනික ගැටළු) | adcsdos2.pubad@gmail.com |
| එස්. ශිෆ්කා මිය | ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ සේවය ස්ථිර (කිරීම් ) | adcsdos4.pubad@gmail.com |
| පී.කේ.පත්බේරිය මෙය | ඒකාබද්ධ සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ (අන්තර්ග්‍රහණ, විශ්‍රාම ගැන්වීම්, ප්‍රතිපත්ති කටයුතු) | adcsdos5.pubad@gmail.com |
| ජී.එච්.එච් ගමගේ මෙය | ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ (උසස් කිරීම්) | adcsdos6.pubad@gmail.com |
| | **බඳවාගැනීම් සහ විභාග** | |
| ඩබ්.ඩබ්.එල්.එල්.ටී.විජේවික්‍රම මයා | ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ (බඳවාගැනීම් සහ විභාග ශාඛාව) | adcs.rec.pubad@gmail.com |
| | **විනය** | |
| කේ.එම්.එන් දිල්හාරි මිය | ඒකාබද්ධ සේවා සහකාර අධ්‍යක්ෂ ( විනය ශාඛාව) | adcs.disc.pubad@gmail.com |